(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 4(8).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2011 නොවැම්බර් මස 14 වැනි සඳුදා

## 2011 නොවැම්බර් මස 21 වැනි සඳුදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

නගර සහ ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත යටතේ නියෝග (අංක 1),— 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ 67 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 16 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය, 17 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (අ) ඡේදය සහ 18 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2011 මැයි 10 දිනැති අංක 1705/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.11.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත යටතේ නියෝග (අංක 2),— 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ 36 වැනි සහ 38 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2011 ජූලි 20 දිනැති අංක 1715/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.11.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2011 දෙසැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0678/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) හම්බන්තොට සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිවන ඉඩම රජය විසින් බදු හෝ වෙනත් ක්‍රමයකට බාහිර පාර්ශ්වයක් වෙත පවරනු ලැබුවේද;

(ii) එසේ පවරා දෙනු ලැබුවේ කවරෙකුටද;

(iii) එම ඉඩම පවරා දුන් මුදල, පැවරුම සිදුකළ වර්ෂය හා ඉඩමේ ප්‍රමාණය කවරේද;

(iv) එම ක්‍රීඩාපිටිය ගොඩනැගීමෙන් පසු එහි අයිතිය පැවරෙන පාර්ශ්වය කවරේද;

(v) පවරනු ලබන කාල සීමාව හා මුදල කොපමණද;

(vi) එමගින් අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගනය ඉදිකිරීම් සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එම මුදල වැය කරන ලද්දේ රජය හෝ රජයේ ආයතනයක් විසින්ද; නැතහොත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හෝ වෙනත් ආයතනයක් විසින්ද;

(iii) එසේ නම්, එක් එක් පාර්ශ්ව විසින් වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගනය සහ එහි ගෘහ නිර්මාණ කටයුතු සඳහා උපදෙස් ලබා දෙන්නේ කවුරුන්ද;

(ii) ක්‍රීඩාපිටිය, ක්‍රීඩා මණ්ඩපය, දිවා රාත්‍රී විදුලි බුබුළු සඳහා වැය කළ මුදල සහ වාර්ෂික නඩත්තුව සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1336/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පැතුම්ගම ග්‍රාම නිලධාරි වසමේ ඉදිකරන ලද ජල යෝජනා ක්‍රමය වර්ෂ 3ක පමණ කාලයක සිට අක්‍රීයව පවතින බවත්;

(ii) එම ජල ව්‍යාපෘතියට අයත් භෞතික සම්පත් සියල්ල භාවිතයට නොගෙන අත්හැර දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා මුදල් ආයෝජනය කරන ලද ආයතන කවරේද;

(ii) ඒ සඳහා වැයකර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘතියට අයත් සම්පත් ප්‍රතිසංස්කරණය කොට නැවත භාවිතයට නොගෙන අත්හැර දැමීමට හේතු කවරේද;

(ii) මෙම ජල ව්‍යාපෘතිය යථා තත්ත්වයට පත්කොට නැවතත් ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම් , ඒ සඳහා ගත වන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1479/’11

ගරු අජිත් කුමාර මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1525/’11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු කොළඹ වරායේ වැඩ නිම කරනු ලබන දිනය කවරේද;

(ii) එම වරායේ වැඩ නිම වූ තත්ත්වය කරා එළඹීමට අවසන් කළ යුතු අදියර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දකුණු කොළඹ වරායේ දිය කඩනයේ ඉදිකිරීම් කටයුතු නිම කරනු ලබන දිනය කවරේද;

(ii) දියකඩනය ඉදිකිරීම සඳහාවන පිරිවැය කොපමණද;

(iii) දියකඩනය ඉදිකිරීම සඳහා වන පිරිවැය දරනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත කී වරායේ නැංගුරම් ස්ථානවල ඉදිකිරීම් කටයුතු නිම කරනු ලබන දිනය කවරේද;

(ii) මුදල් යොදවා ඉහත කී නැංගුරම් ස්ථාන ඉදිකිරීමට පුද්ගලික අංශයේ සමාගම් ඉදිරිපත් වී තිබේද;

(iii) එසේ නම්, එකී සමාගම්වල නම් සහ ඔවුන්ට ලබා දෙන පහසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1612/'11

ගරු ඊ. සරවනපවන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය මහනගර සභාවේ නගරාධිපති සභාවේ අනුමැතියකින් තොරව අත්තනෝමතික තීරණ ගනිමින් යාපනය නගරයේ වගුරුබිමක සිව්මහල් ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට අනුමැතිය ලබාදී ඇති බවත්;

(ii) යාපනයේ හිටපු පුරපති දිවංගත රවිරාජ් මහතා එම වගුරුබිමෙහි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කළ යෝජනාවක් පස් පිළිබඳ සිදු කළ ශක්‍යතා වාර්තාවේ නිර්දේශ හේතුවෙන් ක්‍රියාත්මක නොකළ බවත්;

(iii) කිසිදු පස් පරීක්ෂාවකින් තොරව එම වගුරුබිමෙහි මේ වන විට සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිකරනු ලබන බවත්;

(iv) එම ඉදිකිරීම පසුකාලීනව ජීවිත හා දේපළ හානි සිදුවීමට හේතුවිය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීමටත් පෙර ඉදිකිරීම්කරු කඩ කාමර කිහිපයක් විකුණා ඇති බවත්;

(ii) එහිදී රු. 19,000,000කට විකුණනු ලැබූ කඩ කාමරවලට රු. 11,000,000කට පමණක් ඔප්පු ලියා අත්තිකාරම් වශයෙන් රු. 50,000 බැගින් ලබාගෙන ඇති බවත්;

(iii) එමගින් මහනගර සභාවට ආදායම අහිමිවීමක් හා ආදායම් බදු වංචාවක් සිදුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත තත්ත්වය වැළැක්වීමට මූලික පරීක්ෂණයක් පවත්වා නිසි පියවර ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1682/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ ක්‍රීඩා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී ක්‍රීඩා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1704/'11

ගරු අනුර දිසානායක මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වර්ෂයේ සිට මේ දක්වා මිල්කෝ ආයතනය විසින් මාසිකව මිලදී ගනු ලබන කිරි ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන්කොපමණද;

(ii) මිල්කෝ ආයතනය එකතු කරනු ලැබූ කිරිවලින් කිරි පිටි නිෂ්පාදනය සඳහා භාවිත කරනු ලබන කිරිවල ප්‍රතිශතය, 2008 වර්ෂයේ සිට වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පිටරටින් කිරි ආනයනයකොට හයිලන්ඩ් ලේබලය යටතේ වෙළඳපොළට නිකුත් කරන්නේද;

(iv) නොඑසේ නම්, එසේ කිරීමට බලාපොරොත්තුවන්නේද;

(v) එසේ නම්, ආනයනික කිරි හයිලන්ඩ් ලේබලය යටතේ නිකුත් කිරීමේ අරමුණ කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2011 දෙසැම්බර් මස 02 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0959/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකාවේ නීතිගත කරන ලද බලපත්‍රලාභී කැසිනෝ ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පවත්වාගෙන යන ස්ථාන කවරේද;

(iii) ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් ආයතනය ආරම්භ කළ වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2005 සිට මේ දක්වා කැසිනෝ ශාලා වෙතින් රජයට ලැබුණු බදු ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කැසිනෝ ශාලාවක් ආරම්භ කිරීමට බලපත්‍රයක් ලබා ගන්නා ක්‍රමවේදය කවරේද;

(iii) බලපත්‍ර ලබාදීමේදී අවසන් අනුමතිය ලබා දෙන්නා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේදී කැසිනෝ ශාලා නව බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව කවරේද;

(ii) ඒ අතරින් බලපත්‍ර ලබා දෙන සංඛ්‍යාව කවරේද;

(iii) එසේ බලපත්‍ර ලබන අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1351/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පාලනය කරනු ලබන අරමුදල් යොදවා පෞද්ගලික බැංකුවල කොටස් මිලදීගැනීමේ වැඩ පිළිවෙළක් රජය ක්‍රියාත්මක කරමින් සිටින බවත්;

(ii) එසේ කටයුතු කිරීම බැංකු ක්ෂේත්‍රයේ ආචාර ධර්මවලට සහ යහපාලනයට පටහැනි, නීති විරෝධී ක්‍රියාවක් බවත්;

(iii) රජයේ ඉහත ක්‍රියාකලාපය නිසා දේශීය බැංකු ක්ෂේත්‍රයම අර්බුදයකට මුහුණපා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ වන විටත් පෞද්ගලික බැංකු කිහිපයකම අධ්‍යක්‍ෂ මණ්ඩලය සඳහා රජයට සම්බන්ධ පුද්ගලයන් පත් කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය, අධ්‍යාපන සුදුසුකම් සහ වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1480/'11

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1526/'11

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා විදුලි සමාගමේ,

(i) ගෙවා නිමි ප්‍රාග්ධනය කොපමණද;

(ii) කොටස්කරුවන්ගේ නම් කවරේද;

(iii) සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ලංකා විදුලි සමාගමට අදාළව,

(i) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් වර්ෂයේදී ලැබූ ලාභය කොපමණද;

(ii) මෙම මුදල් වර්ෂයේදී මේ වන විට ලබා ඇති ලාභය හෝ අලාභය කොපමණද;

(iii) ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ප්‍රතිසංස්කරණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ලංකා විදුලි බල සමාගම මගින් සේවය සපයනු ලබන පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, ලංකා විදුලිබල මණ්ඩලය සේවය සපයනු ලබන පාරිභෝගිකයන් සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1679/'11

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ තැපැල් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) මෙම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී තැපැල් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1683/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1699/'11

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැදවච්චිය දුම්රිය ස්ථානයේ සිට මඩු දක්වා දුම්රිය මාර්ගයේ දුර කොපමණද;

(ii) මැදවච්චිය සිට මඩු දක්වා දුම්රිය මාර්ගය පිළිසකර කරනු ලබන සමාගම කවරේද;

(iii) එම සමාගම තෝරාගනු ලැබීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

(iv) එම මාර්ගය ඉදිකිරීම සඳහා වැයවන මුළු මුදල කොපමණද;

(v) එම මුදල් සපයාගනු ලබන ආකාරය කවරේද;

(vi) ණය මුදලක් මගින් එම මුදල් සපයා ගනු ලබන්නේ නම්, ඊට අදාළ පොලී අනුපාතයන් හා එම ණය ආපසු ගෙවීමේ කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2011 දෙසැම්බර් මස 03 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1316/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ හිල්ටන් හෝටලය රජයට පවරා ගනු ලැබූ දිනය කවදාද;

(ii) එය රජයට පවරා ගැනීමට හේතුවූ කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය නැවත එම එම හෝටලය විකිණීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා තීරණය කර ඇති වටිනාකම කොපමණද;

(iii) එය මිලදී ගනු ලබන පුද්ගලයා හෝ ආයතනය කවරේද;

(iv) එම ගනුදෙනුව සිදුකරනු ලබන්නේ බදු පදනම යටතේද; නැතහොත් ස්ථිර පදනම යටතේද;

(v) එම මිලදීගැනීම බලපවත්නා කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1337/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල, දඹුල්ල සහ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනට මායිම්ව වැවමැඩිල්ල ජලාශය පිහිටා ඇති බවත්;

(ii) එම ජලාශය ඉදිකර වර්ෂ නවයක් ගතවී ඇතත් ජලාශයට යට වූ ඉඩම් වෙනුවෙන් එම ඉඩම් හිමියන්ට මේ දක්වා වන්දි මුදල් ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජලාශයට යටවූ ඉඩම්වල හිමිකරුවන්ට වන්දි මුදල් ගෙවීම සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එම වන්දි මුදල් ගෙවීමට ඇති බාධාවන් කවරේද;

(iii) එම බාධාවන් ඉවත් කර කඩිනමින් වන්දි මුදල් ලබා දීමට සැලසුම් කර තිබේද;

(iv) එසේ නම්, එම වන්දි ගෙවීම සිදුකරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1481/'11

ගරු අජිත් කුමාර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ මේ වනවිට, සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1527/'11

ගරු රවී කරුණානායක මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වත්මන් වාර්ෂික තේ නිෂ්පාදනය කොපමණද;

(ii) වත්මන් වාර්ෂික තේ දළ ඵලදාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර තේ නිෂ්පාදනය කොපමණද;

(ii) ජාත්‍යන්තර තේ වෙළඳපොළේ ශ්‍රී ලංකා වෙළඳපොළ කොටස කොපමණද;

(iii) තේ නිපදවන අනෙකුත් රටවල නම් කවරේද;

(iv) එම රටවල එක් හෙක්ටයාරයක් සඳහා ඵලදාව සහ සමස්ත වාර්ෂික නිෂ්පාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහළ ඵලදාවක් ඉලක්ක කරමින් දේශීය තේ වගාව සඳහා සැලසුම් යළි සකස් කිරීමට කිසියම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(ii) 2017, 2022, 2027 සහ 2030 වර්ෂ සඳහා ශ්‍රී ලංකාවේ නිපදවීමට අපේක්ෂිත තේ ප්‍රමාණය අනුපිළිවෙළින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1684/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ ඉඩම් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී ඉඩම් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1690/'11

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ පරිසරය සුරැකීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) එමගින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1700/'11

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩු දුම්රිය ස්ථානයේ සිට තලෙයිමන්නාරම දක්වා දුම්රිය මාර්ගයේ දුර කොපමණද;

(ii) මඩු සිට තලෙයිමන්නාරම දක්වා දුම්රිය මාර්ගය පිළිසකර කරනු ලබන සමාගම කවරේද;

(iii) එම සමාගම තෝරාගනු ලැබීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

(iv) එම මාර්ගය ඉදිකිරීම සඳහා වැයවන මුළු මුදල කොපමණද;

(v) එම මුදල් සපයාගනු ලබන ආකාරය කවරේද;

(vi) ණය මුදලක් මගින් එම මුදල් සපයා ගනු ලබන්නේ නම් ඊට අදාළ පොලී අනුපාතයන් හා එම ණය ආපසු ගෙවීමේ කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

## 2011 දෙසැම්බර් මස 05 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1338/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය - පිටිගල ප්‍රධාන මාර්ගයේ ඉදිකර ඇති දූවත්ත පාලමේ වැඩ අවසන් වී මාස දෙකක් ගත වීමටත් පෙර බරපතල ලෙස ගිලාබැසීමේ අවදානමකට ලක්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම පාලම ඉදිකිරීම සඳහා,

(i) ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(iii) විදේශ ආධාර ලැබුණේ නම්, ප්‍රදානය කළ රට සහ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු සිදු කළ ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1490/'11

ගරු අජිත් කුමාර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1528/'11

ගරු රවි කරුණානායක මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වත්මන් වාර්ෂික ස්වභාවික රබර් නිෂ්පාදනය කොපමණද;

(ii) රබර් වගාවෙහි වත්මන් වාර්ෂික රබර් කිරි අස්වැන්න කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර ස්වභාවික රබර් නිෂ්පාදනය කොපමණද;

(ii) ජාත්‍යන්තර ස්වභාවික රබර් වෙළඳපොළේ ශ්‍රී ලංකා වෙළඳපොළ කොටස කොපමණද;

(iii) ස්වභාවික රබර් නිපදවන අනෙකුත් රටවල නම් කවරේද;

(iv) එම රටවල එක් හෙක්ටයාරයක් සඳහා අස්වැන්න සහ සමස්ත වාර්ෂික නිෂ්පාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහළ අස්වැන්නක් ඉලක්ක කරමින් දේශීය රබර් වගාව සඳහා සැලසුම් යළි සකස් කිරීමට කිසියම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද;

(ii) 2017, 2022, 2027 සහ 2030 වර්ෂ සඳහා ශ්‍රී ලංකාවේ නිපදවීමට අපේක්ෂිත ස්වභාවික රබර් ප්‍රමාණය අනුපිළිවෙලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1537/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා සිටින ගොවි විශ්‍රාම වැටුප් ලබන සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්‍රාම වැටුප ලබා ගැනීමට සම්පූර්ණ කළ යුතු වයස් සීමාව කවරේද ;

(iii) ගොවි විශ්‍රාම වැටුපට දායක වී එකී වයස් සීමාව පසු වන තෙක් සිටින සාමාජික සංඛ්‍යාව කොපමණද;

(iv) එම විශ්‍රාම වැටුපට දායක වී ඉහත කී වයස් සීමාව පසු කර ගොවි විශ්‍රාම වැටුප් නොලබන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) (i) ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය නවත්වා වෙනත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කිරීමට රජය විසින් කටයුතු කරන්නේද;

(ii) වෙනත් ක්‍රමයක් ඇති කරන්නේ නම්, මේ වන තෙක් සාමාජිකත්වය ලබා ඇති සාමාජිකයින්ගේ විශ්‍රාම වැටුප සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ,ඒ මන්ද?

1680/'11

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ ළමා සංවර්ධන හා කාන්තා කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) මෙම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී ළමා සංවර්ධන හා කාන්තා කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1681/'11

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි ,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා වූ කාල සීමාව තුළ රාජ්‍ය සේවයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ක්‍රියාමාර්ග හරහා රාජ්‍ය සේවකයින්ට හා ජනතාවට ලැබී ඇති සහනයන් කවරේද;

(iii) රජයේ සේවක සංඛ්‍යාව වැඩි කිරීම සඳහා පසුගිය වර්ෂ 5 තුළ ක්‍රියා කර ඇති ආකාරය කවරේද;

(iv) ඉදිරියේදී රාජ්‍ය සේවය කාර්යක්ෂම සේවාවක් බවට පත් කිරීම සඳහා ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග කවරේද;

(v) ඒ මගින් රාජ්‍ය සේවකයන්ට ලැබෙන සහනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1685/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ ධීවර ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී ධීවර ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 දෙසැම්බර් මස 06 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1339/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තරුණ තරුණියන් වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වාගෙන ගිය ප්‍රාදේශීය යෞවන සම්පත් කේන්ද්‍රය භාවිතයට නොගෙන වර්ෂ කිහිපයක සිට වසා දමා ඇති බවත්;

(ii) එම හේතුවෙන් නායකයින් බිහිවීමට සහ වෘත්තීය හා ක්‍රීඩා කුසලතා ලබා ගැනීමට තරුණ තරුණියන්ට තිබූ අවස්ථාව අහිමි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම සම්පත් කේන්ද්‍රය අත්හැර දැමීමට හේතු වූ බාධක කවරේද;

(ii) එම බාධක කඩිනමින් ඉවත්කර මෙම සම්පත් කේන්ද්‍රය ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ ප්‍රයෝජනය සඳහා ජනතා අයිතියට නැවතත් පැවරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1531/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) රැකියා සඳහා විදේශ රටවලට ගිය තැනැත්තන් විසින් විදේශ රැකියා නියුක්ති කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) රැකියා සඳහා විදේශ රටවලට ගිය තැනැත්තන්ට රක්ෂණ ආවරණය ලබාදීම මගින් රජය විසින් උපයා ගත් ආදායම කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රැකියා සඳහා විදේශ රටවලට යන සේවකයින් හට රක්ෂණ ඔප්පු ලබා දීමට සුදුසුකම් ලබා ඇති රක්ෂණ සමාගම් කවරේද;

(ii) එම සමාගම් තෝරා ගනු ලබන්නේ නිසි ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීම මගින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1541/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා මගනැගුම යන්ත්‍රෝපකරණ හා ඉදි කිරීම් සමාගම විසින් එක් එක් දිස්ත්‍රික්කයේ ඉදි කරන ලද මාර්ග හා පාලම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මාර්ග හා පාලම්වල නම් කවරේද;

(iii) එම එක් එක් මාර්ගය සහ පාලම වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පාලම් හා මාර්ග ඉදිකිරීම් අතරින් මග නැඟුම ආයතනය විසින් ලබාදුන් කොන්ත්‍රාත් අනුව වෙනත් ආයතන මඟින් ඉදිකළ මාර්ග හා පාලම් තිබේද;

(ii) එම ඉදිකිරීම් සිදු කළ වෙනත් ආයතනවල විස්තර කවරේද:

(iii) ඔවුන් විසින් ඉදි කරන ලද මාර්ග හා පාලම්වල වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

1688/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1350/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, වලවේවත්ත පාරේ, ඕලුවිල සහල් පිටි ආශ්‍රිත කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට මුල්ගල් තබා ඇතත්, එම ව්‍යාපෘතිය අතරමග නවතා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම කර්මාන්ත ශාලාව කඩිනමින් ආරම්භ කොට ප්‍රදේශයේ ජනතාව අතර සහල් පිටි ජනප්‍රිය කරවීම සඳහා කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, මෙම ගොඩනැගිලි සහ භූමිය වෙනත් කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1532/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ ඇතැම් ඉඩම්, ජලය රඳවා තැබිය හැකි ජලාශ බවට පරිවර්තනය කිරීම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම ජලය රඳවා තැබිය හැකි ජලාශ පිහිටි ස්ථානයන් කවරේද;

(iii) එකී ජලාශ විශාල කිරීමේදී එක් ජලාශයක් වෙනුවෙන් දැරීමට සිදුවූ පිරිවැය කවරේද;

(iv) ඉහත කී පරිවර්තනය කිරීමෙන් අනතුරුව රඳවා තබාගත හැකි අමතර ජල පරිමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොළඹ දැනට පවතින ජලාශ හාරා ඒවායේ රොන්මඩ ඉවත්කිරීම සිදුකර තිබේද;

(ii) එසේ නම්, එය සිදුකළ කාල සීමාව කවරේද;

(iii) රොන්මඩ හාරා ඉවත්කිරීම වෙනුවෙන් දැරීමට සිදුවූ වියදම කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ගොඩබිම සිට මුහුදට ජලය ගලා යෑම සඳහා වැල්ලවත්ත, රත්මලාන සහ කොළඹ වරාය අසල යන ස්ථානවල සවිකර ඇති සොරොව් දොරටු පුළුල් කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1556/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑත කාලයේදී නැගෙනහිර පළාතේ ඇති වූ ගංවතුර ගැලීම්වලදී අවතැන්වූ ජනතාවගේ සුභසාධනය සඳහා මහජන බැංකුව විසින් වෙන් කළ මුදල කොපමණද;

(ii) ඒ යටතේ සුභසාධන පහසුකම් ලබා ඇති අවතැන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් පවුලක් වෙනුවෙන් ලබාදී ඇති මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ආධාරවල වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අවතැන්වූ ජනතාවට ලබාදීමට වෙන් කළ එම මූල්‍යාධාර, ඔවුන්ට ලබා දීම සඳහා භාරගත් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) අවතැන් වූ ජනතාව වෙනුවෙන් එම සුභසාධන කටයුතු ඉටු කළ බවට ඉදිරිපත් කළ හැකි සාක්ෂි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 දෙසැම්බර් මස 07 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1066/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එක් ගම්මානයක සාමාන්‍යයෙන් වාසය කරන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙරට ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙරට සිටින ප්‍රාදේශීය ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න මෑතකදී ලබාගත් ජනසංගණන සංඛ්‍යාලේඛන ආශ්‍රයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් පළාත, දිස්ත්‍රික්කය, මැතිවරණ කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිහිටා ඇති ගම්මාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය කොපමණද;

(iii) මීළඟ නිල ජනසංගනනය පැවැත්වීමට නියමිතව ඇති දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1352/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර, කුරුවිට, මහවත්ත කන්ද සිට තැනීපිට තේ ජනපදය දක්වා විදුලිය ලබා දීම සඳහා විදුලි පරිණාමකයක් (Transformer) ස්ථාපිත කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි පරිණාමකය (Transformer) සවි කර තිබියදීත් තැනීපිට තේ ජනපද ප්‍රදේශයේ ජනතාවට විදුලිය ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම ප්‍රදේශයේ ජනතාවට විදුලිය ලබා දීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) විදුලිය ලබා දෙන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1482/'11

ගරු අජිත් කුමාර මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික උරුමයන් අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1562/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවය සඳහා තරඟ විභාග පැවැත්වීමකින් තොරව සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ යටතේ බඳවා ගන්නා සංඛ්‍යාව කොපමණද;

(iii) එම පිරිස බඳවා ගැනීමේදී සලකා බලනු ලබන අවම සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ තරඟ විභාග සඳහා ඉදිරිපත් ව වැඩි ලකුණු ලැබූ දහස් සංඛ්‍යාවක් මේ වන විටත් රැකියා නොලබා සිටිය දී තරඟ විභාග පැවැත්වීමකින් තොරව ඉහත සඳහන් පරිදි සිදුකරනු ලබන බඳවා ගැනීම් හේතුවෙන් විභාගවලට මුහුණදුන් පිරිසට බලවත් අසාධාරණයක් සිදුවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, තරඟ විභාග සඳහා ඉදිරිපත් වී සමත්ව සිටින පිරිසට රැකියා ලබාදීමට සාධාරණ වැඩ පිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1353/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, බිබිල අධ්‍යාපන කලාපයට අයත්, මැදගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලෙහි වහලය දිරාපත් වී විනාශ වී යාමේ තර්ජනයට මුහුණපා ඇති බවත්;

(ii) එම තත්ත්වය කාර්යාලයේ සේවකයින්ගේ ජීවිතවලට අනතුරුදායක මෙන්ම පරිපාලන කටයුතු අඩාල කිරීමටද හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කාර්යාල ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, ඒ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1533/'11

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ජන සභා" පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, පිහිටුවා ඇති ජන සභා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටුවීමේ පදනම සහ අරමුණ කවරේද;

(iv) ජන සභා කවර බලධාරීන් විසින් පාලනය කරනු ලැබේද;

(v) ජන සභාවන්හි විෂය පථය කවරේද;

(vi) ජන සභා පවත්වාගෙනයෑමේ වියදම කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) (i) ජන සභා කවර නියෝජිතයන්ගෙන් සමන්විත වී තිබේද;

(ii) ජන සභා පත්කිරීම නිසා වසා දමනු ලැබූ ආයතන තිබේද;

(iii) එසේ නම්, එලෙස වසා දැමූ ආයතනවල නම් කවරේද;

යන්නත් එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1563/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 මැයි මස සිට මේ දක්වා කැළණිතිස්ස ද්විත්ව බලාගාරයේ ලාභය හෝ අලාභය කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) අලාභ ලැබීමක් සිදුවූයේ නම්,

(i) එයට හේතුව කවරේද;

(ii) එම අලාභය දරනු ලබන අය කවුරුන්ද;

(iii) ඒ සඳහා වගකිව යුත්තේ කවුරුන්ද;

(iv) එම අලාභය ජනතාවට දැරීමට සිදු වූයේ නම්, ඒ සඳහා සහනයක් ජනතාවට ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 දෙසැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1067/'11

ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සිදු කර ඇති රටවල නම් කවරේද;

(ii) එම වෙළෙඳ ප්‍රවර්ධන කටයුතුවල සාර්ථකත්වය කවර මට්ටමක තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශ රටවල රඳවා ඇති අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් සේවකයන්ගේ නම් සහ ඔවුන් රඳවා ඇති රටවල නම් කවරේද;

(iii) විදේශ රටවලට අපනයනය කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහාය ලැබී ඇති වෙළෙඳ භාණ්ඩවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අපනයන සංවර්ධන මණ්ඩලය අපනයනකරුවන්ට විදේශයන්හි සංචාරය කිරීම සඳහා සහාය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම සහාය ලබා දුන් සමාගම්වල නම් සහ ඒ සඳහා 2009 සහ 2010 වර්ෂවලදී අපනයන සංවර්ධන මණ්ඩලය දරන ලද වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1354/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ක්‍රීඩා ගම්මානයන් සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ආසන්නයේ ග්‍රාම නිලධාරී වසම් දෙකකට අයත් ජනතාව පදිංචි, කෘෂිකර්මාන්තයට යොදා ගත් අක්කර 5000ක පමණ භූමි ප්‍රදේශයක් රජයට පවරා ගැනීමේ සැලසුමක් තිබෙන බවත්;

(ii) මේ වන විට ඊට අදාළ මිනුම් කටයුතු ආරම්භ කර ඇති බවත්;

(iii) එම භූමිය තුළ වූ වැව් පහක් සහ රජයේ පාසල් දෙකක් තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් පවරා ගත් පසු එම පාසල් දෙක ඉහත ප්‍රදේශයෙන් ඉවත් කිරීමට කටයතු කරන්නේද;

(ii) එසේ නම්, නැවත ඒවා ස්ථාපිත කරනු ලබන ප්‍රදේශය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ඉඩම් පවරා ගැනීමෙන් නිවාස සහ ඉඩම් අහිමි වන ජනතාවට නැවත නිවාස සහ ඉඩම් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, ඉඩම් හා නිවාස ලබා දෙන ප්‍රදේශය කවරේද;

(iii) ඒ සඳහා යොදා ගන්නා ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1596/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,—අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස් ත්‍යාග අරමුදල සඳහා මුදල් ලැබෙන ආකාරය කවරේද;

(ii) එම අරමුදලේ මේ වන විට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම අරමුදලේ මූල්‍ය වත්කම් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන්කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට එම අරමුදලින් ත්‍යාග ලබාගත් පොලිස් නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ට ලබාදී ඇති ත්‍යාග කවරේද;

(ii) මේ වන විට තෑගි ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

1686/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1068/’11

ගරු රවි කරුණානායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව සමඟ ඇති කරගෙන තිබෙන වරණීය, ද්වි පාර්ශ්වීය සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) නව ගිවිසුම් සම්බන්ධයෙන් වෙනත් කිසියම් රටක් සමඟ දැනට සාකච්ඡා පැවැත්වෙමින් තිබෙන්නේද;

(iii) ඇමරිකා එක්සත් ජනපදය සමග ඇතිකර ගත් වෙළෙඳ ආයෝජන සහ පාදක ව්‍යුහ ගිවිසුම (TIFA) හි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) වරණීය වෙළෙඳ ගිවිසුම් සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආසියානු රටවල් සමඟ ශ්‍රී ලංකාව ඵලදායී ලෙස වෙළෙඳ කටයුතුවල නොයෙදීමට හේතු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1355/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුධ හමුදා යාන්ත්‍රික පාබල බළඇණියේ සේවා වනිතා ඒකකය මගින් සංගීත සංදර්ශනයක් පැවැත්වීම සඳහා එම රෙජිමේන්තුවේ එක් නිලධාරියෙකුගේ 2011 මාර්තු මාසයේ වැටුපෙන් රුපියල් පන්දාහක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇති බවත්;

(ii) එම මුදල වැටුපෙන් අයකර ගනු ලබන විටත් එම මාසයේම රෙජිමේන්තුව මගින් විකිණීමට දුන් ටිකට් පොත් වෙනුවෙන් රුපියල් හාරදහසක් පමණ මුදලක් එම සංගීත සංදර්ශනය වෙනුවෙන් ලබා දී තිබූ බවත්;

(iii) ඉහත පරිදි මාසික වැටුපෙන් එක්වර රුපියල් පන්දහසක මුදලක් අයකර ගැනීමෙන් යුද හමුදා පවුල්වල සාමාජිකයින් දැඩි ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා වැරදිකරුවන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1597/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2600 සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් හඳුන්වා දෙන ලද මුද්දර සංඛ්‍යාව කොපමණද;

(ii) එයින් මේ වන විට මුද්‍රණය කර ඇති මුද්දර සංඛ්‍යාව කොපමණද;

(iii) එම මුද්දර නිකුත් කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හඳුන්වා දෙන ලද එක් එක් මුද්දරයන්හි රූප අර්ථ ගැන්වීම් කවරේද;

(ii) එම මුද්දර නිර්මාණය කිරීමට පත් කළ කමිටුවේ හෝ සංස්කරණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම් කවරේද;

(iii) ඒ සඳහා ඔවුන්ට ඇති සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

---

## 2011 දෙසැම්බර් මස 09 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1199/’11

ගරු රවී කරුණානායක මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහ තුළ, එක් එක් වර්ෂයේ දී,

(i) සමස්ත පොල් පරිභෝජනය සහ ඒක පුද්ගල පොල් පරිභෝජනය කොපමණද;

(ii) ආනයනය කරන ලද පොල් ප්‍රමාණය කොපමණද;

(iii) ආනයනය කරන ලද පොල්වල වටිනාකම කොපමණද;

(iv) පොල් ආනයනකරුවන්ට රජය විසින් සත්‍ය වශයෙන්ම ලබා දෙන සහනාධාරය, එය සනාථ කිරීමට අවශ්‍ය කරුණු ද සමග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දේශීයව නිෂ්පාදනය කරන සහ ආනයනය කරන ලද පොල් මත පනවා ඇති ඍජු සහ වක්‍ර බදු වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1356/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ, වවුනියාව, කිලිනොච්චි, මුලතිව්, මන්නාරම හා යාපනය යන දිස්ත්‍රික්කවල මෙවර මහ කන්නයේ වගා කරන ලද කව්පි, උඳු, මුං සහ පලතුරු හෙක්ටයාර් 9264 ක් වර්ෂාව හා ගංවතුර නිසා විනාශයට පත් වී ඇති බවත්;

(ii) ඉහත පරිදි වගාවන් සහ අස්වැන්න විනාශ වීම නිසා එම ප්‍රදේශවල ගොවීන් දැඩි අපහසුතාවන්ට මුහුණපා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොවීන්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීම සහ නැවත වගා කටයුතු සිදු කිරීම සඳහා සහනාධාර ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකසා තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) එම සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1486/’11

ගරු අජිත් කුමාර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1599/’11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිවරයාගේ සම්පූර්ණ නම හා වයස;

(ii) ඔහු මීට පෙර සේවය කළ ස්ථානය හා තනතුර;

(iii) ඔහුගේ වෘත්තීය පලපුරුද්ද;

(iv) ඔහුගේ වර්තමාන මාසික වැටුප සහ වෙනත් දීමනා;

(v) මීට පෙර ලබා දුන් වෙනත් දීමනා;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වත්මන් සභාපතිවරයා එම තනතුරට පත් කළ බලධාරියා කවුරුන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

1200/’11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007, 2008, 2009 සහ 2010 වර්ෂවලදී ශ්‍රී ලාංකිකයින් රැකියා සඳහා ගිය රටවල නම් කවරේද;

(ii) ඉහත සඳහන් වර්ෂවලදී රැකියා සඳහා මෙම රටවලට ගිය ස්ත්‍රීන් සහ පුරුෂයින් සංඛ්‍යාව එක් එක් වර්ෂය සහ එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් විසින් උපයාගත් සාමාන්‍ය වැටුප කොපමණද;

(iv) ඔවුන්ට ලැබෙන වැටුපෙහි අවම වැටුප් මට්ටමක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1357/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හැටන් - නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ, තලවාකැලේ ප්‍රදේශයේ මාර්ගය මේ වන විට දැඩි ලෙස අබලන්ව ඇති බවත්;

(ii) එම තත්ත්වය නිසා ගමනාගමනයේදී එම ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවන්ට මුහුණපාන බවත්,

(iii) දැඩි ලෙස අබලන් වූ එම මාර්ගය ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා බාධාවක් වී ඇති බවත්:

එතුමා දන්නෙහිද?

(ආ) (i) හැටන් - නුවරඑළිය මාර්ගයේ තලවාකැලේ කොටස අලුත්වැඩියා කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) මේ වන විට, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) එම මාර්ගයේ සංවර්ධන කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1600/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා ඇතුළු පිරිස 2011.05.09 හෝ ඊට ආසන්න දිනක යෙදුනු ඇමෙරිකානු සංචාරයේ අරමුණ කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒ සඳහා සහභාගී වූ අයගේ නම් සහ තනතුරු කවරේද;

(ii) ඔවුන් නවාතැන් ගත් ස්ථාන සහ එම ස්ථානයන් සඳහා රජය විසින් දරන ලද වියදම කොපමණද;

(iii) එම සංචාරය වෙනුවෙන් රජය විසින් දරන ලද ගුවන් ගමන්, අභ්‍යන්තර ගමන් බිමන් සහ අනෙකුත් වියදම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම සංචාරය මඟින් ශ්‍රී ලංකාව ලබා ගත් ප්‍රතිලාභ කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

## 2011 දෙසැම්බර් මස 12 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1305/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට මෙරට ක්‍රියාත්මකවන විශාලතම විදේශ රැකියා නියෝජිත ආයතන විස්සෙහි නම් කවරේද;

(ii) එම ආයතන විසින් පසුගිය වර්ෂ තුන තුළ පිටරට රැකියා සඳහා යවන ලද තැනැත්තන් සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(iii) රජය විසින් එම විදේශ රැකියා නියෝජිත ආයතනවලට ලබාදෙන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1358/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුවක්ගහහේන ග්‍රාම නිලධාරී වසමේ ප්‍රජා ජල ව්‍යාපෘතිය මීට මාස කිහිපයකට පෙර ප්‍රතිසංස්කරණය කළ නමුත් ඉන් නිසියාකාර ජල සැපයුමක් නොලැබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය වූ මුදල කොපමණද;

(ii) ඊට ප්‍රතිපාදන ලබා දුන් ආයතනය හෝ ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ජල යෝජනා ක්‍රමයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) අදාල ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම ජල ව්‍යාපෘතිය ජනතාවට පානීය ජලය ලබා ගැනීමට හැකි වන පරිදි සකස් කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1659/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් පදමින් සිටි සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, තනතුරු, අදාළ වැටුප් සහ ලබා දෙන වෙනත් පහසුකම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සේවකයින් අතුරින් 2011 වර්ෂයේදී ප්‍රසාද දීමනා ගෙවා ඇති සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ නතතුරු කවරේද;

(iii) එක් එක් සේවකයාට ලබාදුන් ප්‍රසාද දීමනා මුදල කොපමණද;

(iv) ඒ වෙනුවෙන් දරන ලද මුළු වියදම කොපමණද;

(v) ඒ සඳහා මුදල් ලබා ගත් මාර්ගය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

1687/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ වැවිලි ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී වැවිලි ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1312/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 සහ 2011 වර්ෂවලදී,

(i) ආරක්ෂක අමාත්‍යාංශය මගින්, එම අමාත්‍යාංශයට අයත් නොවන කුළියට හෝ බද්දට ගත් ගොඩනැගිලි සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(ii) කුළියට හෝ බද්දට ගනු ලැබූ ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා වන මිල ගණන් කවරේද;

(iii) මෙම ගොඩනැගිලි බද්දට ගත් කාලසීමාව කවරේද

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එක් එක් වර්ෂයේදී,

(i) අමාත්‍යාංශයට සම්බන්ධ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුළියට හෝ බද්දට ගැනීම සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(ii) අමාත්‍යාංශය සතු සම්පූර්ණ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිර ආයතනවලින් ලබාගත් අනෙකුත් සේවා කවරේද;

(iv) ඉහත සඳහන් කළ බාහිර ආයතනවලින් ලබාගත් සේවා සඳහා දරන ලද පිරිවැය කොපමණද;

(v) බාහිර ආයතනවලින් සේවය ලබාගන්නා පදනම මත සේවය ලබාගෙන ඇති පුද්ගලයින් සංඛ්‍යාව කවරේද;

(vi) සමස්ත කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සංඛ්‍යාව කවරේද;

යන්නත් ආරක්ෂක අමාත්‍යාංශයට අදාළව, වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1359/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, වැත්තෑවේ කාබනික පොහොර නිෂ්පාදනාගාරය, ජනාකීර්ණ මාවතක් ආසන්නයේ ස්ථාපිත කර ඇති බවත්;

(ii) ඒ හේතු කොට ගෙන ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යයට දැඩි තර්ජන එල්ලවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත තත්ත්වය සලකා බලා එම කාබනික පොහොර නිෂ්පාදනාගාරය ජනශූන්‍ය ප්‍රදේශයක පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වන විට සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එය නැවත ස්ථාපනය කිරීමට යෝජිත ස්ථානය කවරේද;

(iv) එම ස්ථානයේ පොහොර නිෂ්පාදනාගාරය ස්ථාපිත කිරීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1660/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා සඳහා පෞද්ගලික වෛද්‍යවරයෙක් සිටින්නේද;

(ii) එසේ නම්, ඔහුගේ නම සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) ඔහුගේ වැටුප හෝ වේතනය සහ විශේෂ හෝ වෙනත් දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වෛද්‍යවරයා ජනාධිපතිතුමා සමග විදේශීය සංචාර සඳහා සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, සංචාරය කළ එම රටවල් සහ දින වකවානු කවරේද;

(iii) එම සංචාරවලදී එම වෛද්‍යවරයා වෙනුවෙන් රජය විසින් දරන ලද වියදම එක් එක් සංචාරය සඳහා වෙන්වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 දෙසැම්බර් මස 13 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0594/'10

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) පසුගිය වර්ෂ අටක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) රාජ්‍ය සේවකයින්ට ලබා දී ඇති ණය මුදලේ ප්‍රාග්ධන ගෙවීම සහ ණය පොලී ගෙවීම සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) රුපියල් බිලියන විසිපහක වටිනාකම ඉක්මවන ලද වෙනත් පුනරාවර්තන වියදමක් රාජ්‍ය සේවාව වෙනුවෙන් දරනු ලැබුවේ නම්, එම වියදම සහ එහි ප්‍රමාණය කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1364/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, මඩල - දම්මුල්ල - කරදින ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර් තුනක පමණ දුර ප්‍රමාණයක් කාපට් අතුරා සංවර්ධනය කර ඇති බවත්;

(ii) එම සංවර්ධන කටයුතු නිසි ප්‍රමිතියෙන් තොරව සිදු කර ඇති බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ කි.මී. 03 ක දුර ප්‍රමාණය සංවර්ධනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(ii) කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීමට පෙර අදාළ කාර්මික නිලධාරී වාර්තාව ලබා ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් සංවර්ධන කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1497/'11

ගරු අජිත් කුමාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රවාහන අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1795/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 ලෝක කුසලාන ක්‍රිකට් තරගමාලාව සඳහා නම් කළ උපුල් තරංග ක්‍රීඩකයාට වෛද්‍ය ප්‍රතිකාර ලබා දුන් වෛද්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) එම වෛද්‍යවරයා හෝ වෛද්‍යවරුන් වෛද්‍යවරයෙකු ලෙස ලියාපදිංචි වූ වර්ෂයන් සහ ඔවුන්ගේ වෘත්තීයමය පලපුරුද්ද කවරේද;

(iii) එම ක්‍රීඩකයා තහනම් උත්තේජක භාවිතා කර ඇති බවට නැඟී චෝදනා සම්බන්ධයෙන් කළ වෛද්‍ය පරීක්ෂණවල ප්‍රතිඵල අනුව ඔහු ලබාගෙන ඇති බවට සඳහන් තහනම් උත්තේජක වර්ගය කවරක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තහනම් උත්තේජක භාවිතා කිරීම සම්බන්ධයෙන් උපුල් තරංග ක්‍රීඩකයාට එල්ල වී ඇති චෝදනාවෙන් ඔහු මුදවා ගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0595/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 1995 සිට 2000 දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) මෙරට සමස්ත ශ්‍රම බලකාය කවරේද;

(ii) පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ ශ්‍රම බලකායන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රාජ්‍ය අංශයේ, ත්‍රිවිධ හමුදාවල, පොලිසියේ සහ සහායක සේවයේ රැකියාවල නිරත සමස්ථ ශ්‍රම බලකාය සහ රාජ්‍ය සේවයේ අනෙකුත් අංශවල සේවයේ නිරත සමස්ථ ශ්‍රම බලකාය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත සඳහන් රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සියලුම දෙනා විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 15ක කාලය තුළ, රාජ්‍ය අංශයේ සේවය ස්ථිර නොකරන ලද තාවකාලික පත්වීම් කිසිවක් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එකී පත්වීම්වල නම් කවරේද;

(iii) එක් එක් වර්ෂයේදී රජය වැටුප් සඳහා වැය කරන මුදල කෙරෙහි ඉහත කී පත්වීම්වලින් ඇති වූ බලපෑම කවරේද;

(iv) එම පත්වීම් ස්ථිර කරනු ලබන දිනය කවරේද;

(v) අනාගතයේදී එම පත්වීම් ලාභීන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලැබේද; සහ

(vi) එසේ නම්, මෙම කරුණ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රජය විසින් වෙන් කරනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1365/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය සඳහා මේ වනතෙක් පාසල් නිල ඇඳුම් ලබා නොදුන් රජයේ පාසල් තිබේද;

(ii) එසේ නම්, එම නිල ඇඳුම් ලබාදීම ප්‍රමාද වීමට බලපෑ හේතු කවරේද;

(iii) එම පාසල් සඳහා නිල ඇඳුම් ලබාදෙන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයේ ඇතැම් පාසල්වල නිල ඇඳුම් සඳහා ලබාදී ඇති රෙදි නියමිත ප්‍රමිතියට නිෂ්පාදනය කර නොමැති බවට දෙමව්පියන් චෝදනා කරන බැවින් ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා එම පාසල් සඳහා නැවත නිල ඇඳුම් ලබාදීමට කටයුතු කරන්නෙහිද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පාසල් නිල ඇඳුම් සැපයීම සඳහා සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන කවරේද;

(iii) එම ටෙන්ඩර් කරුවන් විසින් සුදු කලිසම්, සුදු කමිස, සුදු ගවුම් රෙදි සහ සිවුරු රෙදි මීටර් එකක් සපයනු ලැබූ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1796/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බොක්සිං ක්‍රීඩක මංජු වන්නිආරච්චි ක්‍රීඩකයාට වෛද්‍ය ප්‍රතිකාර ලබා දුන් වෛද්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) එම වෛද්‍යවරයා හෝ වෛද්‍යවරුන් වෛද්‍යවරයෙකු ලෙස ලියාපදිංචි වූ වර්ෂයන් සහ ඔවුන්ගේ වෘත්තීයමය පලපුරුද්ද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තහනම් උත්තේජක භාවිතා කිරීමට අදාළව මංජු වන්නිආරච්චි ක්‍රීඩකයා සම්බන්ධයෙන් කළ වෛද්‍ය පරීක්ෂණවල ප්‍රතිඵල අනුව ඔහු ලබා ගෙන තිබේ යැයි සඳහන් කළ තහනම් උත්තේජක වර්ගය කවරක්ද;

(ii) ඔහුට එරෙහිව තහනම් උත්තේජක භාවිතා කිරීම සම්බන්ධයෙන් නගා ඇති චෝදනාවෙන් මුදවා ගැනීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඊට අදාළව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 දෙසැම්බර් මස 14 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0596/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයේ මුළු තත්‍ය වියදම (ශුද්ධ ආර්ථික බදු වලය) කොපමණද;

(ii) සෘජු හා වක්‍ර බදු මගින් රජය උපයාගත් ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් කොපමණද;

(iv) රටේ දළ දේශීය නිෂ්පාදිතය කොපමණද;

(v) රජයේ අයවැය හිඟය කොපමණද;

යන්න පසුගිය වර්ෂ දහයට අදාළව, වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එය පියවාගන්නේ කෙසේද සහ අයවැය හිඟය පියවාගැනීම සඳහා ලබාගත් ණය සඳහා වන පොලී පිරිවැය ලබා දෙන්නේ කෙසේද;

(ii) මෙම ජීවනරටාව තවදුරටත් ඉදිරියට ගෙන යාමට හැකිවන්නේද සහ රට ණය උගුලක් කරා ගමන් කරමින් සිටින්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1370/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, වැලිගම, කප්පරතොට, "දර්ශන" හි පදිංචි එස්. ටී. කේ. ජයවීර මහතා ඇතුළු සහෝදරයින්ට අයත් වැලිගම, කප්පරතොට, නව ගාලු පාරේ අංක 153/1 දරන තනිගහවත්ත නැමැති ඉඩමේ පර්චස් 18.235 පමණ ප්‍රමාණයක් වැලිගම නගර සභාව මගින් පවරා ගෙන ඇති බවත්;

(ii) එම පවරාගැනීම සිදුකොට වර්ෂයකට ආසන්න කාලයක් ගතවී ඇතත්, මේ දක්වා වන්දි මුදලක් ගෙවා නොමැති බවත්;

(iii) ගැසට් නිවේදනයක් මගින් පවරා ගන්නා ලද ඉහත ඉඩමට අමතරව එස්. ටී. කේ. ජයවීර මහතා ඇතුළු සහෝදරයින්ට අයත් ඒ අවට ඉඩම් ද හසුවන සේ වැලිගම නගර සභාව මේ වනවිට ගොඩනැගිලි ඉදිකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පවරාගත් ඉඩම වෙනුවෙන් මෙතෙක් වන්දි මුදල් නොගෙවීමට හේතු කවරේද ;

(ii) වන්දි මුදල ගෙවන්නේ නම්, ඊට ගතවන කාලය කවරේද;

(iii) වන්දි ලෙස ගෙවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ඇ) (i) ඉහත අ(iii) හි සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා යොදාගත් ඉඩම් කොටස් සඳහා ද වන්දි මුදලක් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම වන්දි මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1483/'11

ගරු අජිත් කුමාර මහතා,— සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1618/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 මැයි මාසයේ සිට මේ දක්වා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යවරයා / නියෝජ්‍ය අමාත්‍යවරයා යෙදුනු විදෙස් සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචාර සිදුකළ රටවල් කවරේද;

(iii) එම එක් එක් විදෙස් සංචාරයේ අරමුණු හා ලබා ගන්නා ලද ප්‍රතිඵල කවරේද;

(iv) එක් එක් සංචාරය සඳහා සහභාගී වූ නිලධාරීන්, මාධ්‍යවේදීන් හා පුද්ගලික කාර්යමණ්ඩලයේ නිලධාරීන් කවුරුන්ද;

(v) එම සහභාගීවූවන් එක් එක් සංචාරය සඳහා ගමන්ගත් ගුවන් යානයේ පන්තිය හා ඒ සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම සංචාරයන් සඳහා වියදම් වූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0598/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීම,— (3)

(අ) (i) ඉදිරි වර්ෂ 8 සඳහා ප්‍රක්ෂේපිත දළ දේශීය නිෂ්පාදිතය (GDP) කොපමණද;

(ii) මේ දක්වා වූ පසුගිය වර්ෂ අටක කාලය තුළ ඒක පුද්ගල ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

(iii) මේ දක්වා වූ පසුගිය වර්ෂ අටක කාලය තුළ ඒක පුද්ගල ණය ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) 1994/01/01, 2005/01/01 සහ 2010/08/01 යන දිනවලට ඒක පුද්ගල ඉපැයීම හා ණයවල අගයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1394/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස අධ්‍යාපන කලාපයට අයත්, හිග්ගොඩ ශ්‍රී සුමන කනිෂ්ඨ විද්‍යාලය මීට වර්ෂ කිහිපයකට පෙර සිට වසා දමා ඇති බවත්;

(ii) මේ වන විට මෙහි ගොඩනැගිලි දිරාපත් වී පාසල් භූමිය වල් බිහි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල නැවත විවෘත කර, ප්‍රදේශයේ දරුදැරියන්ට අධ්‍යාපනය ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, පාසල් භූමිය සහ ගොඩනැගිලි වෙනත් ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ආර්ථික කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1797/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ඉතාලියේ රැකියාවල යෙදෙමින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා දෙන ශ්‍රමිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ වැටුපෙන් සේවක අර්ථසාධක කපා ගැනීම, බදු අයකිරීම ඇතුළු අනෙකුත් අය කිරීම් එරට රජය විසින් සිදු කරන්නේද;

(iii) එසේ නම්, අයකර ගන්නා ලද සම්පූර්ණ මුදල හෝ ඉන් යම් ප්‍රමාණයක් හෝ අප රටට මේ වන තෙක් ලබා දී තිබේද;

(iv) නොඑසේ නම්, ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සේවයෙන් ඉවත්වී පැමිණීමේදී එරට රජය විසින් ඔවුන් වෙත යම් මුදලක් ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දීර්ඝ කාලීනව විදේශ රටවල සේවය කරමින් විදේශ විනිමය උපයා දෙන ශ්‍රමිකයන් හට විශ්‍රාම වැටුපක් ලබාදීමට රජය කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?